# ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ ( ස්ථිර මාර්ග/ පාලම්/ ගොඩනැගිලි/ කර්මාන්ත ශාලා/ ධාවනාගාර/ සංඥා හා විදුලි ) III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2024 (2025)

## මාර්ගගතව අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

**A.** මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක් පිරවිය යුතුය.

**B.** මාර්ගගත අයදුම්පතේ සඳහන් "Medium, post", "Personal Information", "Educational / Professional Qualifications" යන කොටස් මාර්ගගත ආකාරයෙන් (online) සම්පූර්ණ කළ යුතුය.

**C.** සම්පූර්ණ කරන ලද තොරතුරු නිවැරදිව හා දී ඇති උපදෙස් පරිදි සම්පූර්ණ කර තිබේදැයි පරීක්ෂා කර තහවුරු කරගන්න. (පොදු උපදෙස් හා තාක්ෂණික උපදෙස් පරිදි)

**D.** ඉන් පසු "Submit this application" හා "Proceed to payment" click කර, මුදල් ගෙවා "Complete and Submit" click කර අයදුම්පත මාර්ගගතව යොමු කළ යුතුය.

**E.** අයදුම්පතේ මෘදුපිටපත බාගත කර (download), මුද්‍රිත පිටපතක් (printout) ලබාගත යුතුය.

**F.** අයදුම්කරුවන්හට මුදල් ගෙවීමේ ක්‍රමවේද (Payment Method) වෙනස් කළ හැක්කේ එක් වරක් පමණි.

**G.** දී ඇති උපදෙස්වලට පටහැනිව මාර්ගගතව යොමු කරන ලද

**(අ) පොදු උපදෙස්:**

1. මාර්ගගත (online) විභාග අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණි.
2. අයදුම්පත පිරවීමේදී විශේෂිත අක්ෂර (Special Characters) වන " " ?: { }[ ]'!`~#$%^* <> = + - _ | නොයෙදිය යුතුය. එවැනි විශේෂිත අක්ෂර යොදා සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. විභාග ගාස්තු ගෙවීමේදී පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.
    i. බැංකු ණය කාඩ්පතක් මඟින් (Bank Credit Card)
    ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පතක් මඟින් (Bank Debit Card with internet payment facility)
    iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
    iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Bank of Ceylon branch)

   ඉහත ක්‍රම මඟින් ගෙවීම් කරනු ලබන ආකාරය සඳහා (**ආ**) **තාක්ෂණික උපදෙස්** බලන්න.
4. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලබන අතර, විභාග ගාස්තු ආපසු ගෙවීම (Refund exam payment) හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ කරනු නොලැබේ.
5. අයදුම්කරු විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පතේ දත්ත, මාර්ගගත පද්ධතියට ඇතුළත් කිරීමට පෙර, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවන ලද නීතිරීතිවලට එකඟවන බව තහවුරු කළ යුතුය.

6. අදාළ විභාගයට මුදල් ගෙවා අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු ("**Complete and Submit**"), එය බාගත කර (download), මුද්‍රිත පිටපතක් (printout) ලබාගෙන ළඟ තබා ගත යුතුය.
7. මාර්ගගත අයදුම්පත් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්වේ.
    - අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සහිත මාර්ගගත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
    - මුදල් නොගෙවන ලද අයදුම්පත් (විශේෂිත විභාග සඳහා හැර) ප්‍රතික්ෂේප කරනු ලැබේ.
    - අයදුම්පත නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වගකියනු නොලැබේ.

8. විමසීම් කිරීම - **කාර්යාලීය වේලාවන් තුළදී පමණි.**
   - බඳවා ගැනීම් සහ සුදුසුකම් පිළිබඳව - **ශ්‍රී** ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව - +94 11 4 600 111
   - විභාග අයදුම්පත් යොමු කිරීම පිළිබඳව - 011-2785230, 0113661244
   - ලංකා බැංකු ශාඛා මගින් ගෙවීම් පිළිබඳව - 011 2205280


   .

9. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එහි සඳහන් වන තොරතුරු කිසිදු හේතුවක් මත පසුව වෙනස් කරනු නොලැබේ. එබැවින් අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ පූර්ණ වගකීම වේ.
10. අයදුම්පත භාරගන්නා අවසාන දිනට මෘදු පිටපතේ (Soft copy) සඳහන් තොරතුරු නිවැරැදි තොරතුරු බවට සලකා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

**<u>(ආ) තාක්ෂණික උපදෙස්:</u>**


1. **පද්ධතියට ප්‍රවේශ වීම**
   i. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට ප්‍රවේශ වන්න (www.doenets.lk).
   ii. එහි අපගේ සේවා (Our Services) යටතේ ඇති "**Online Applications (EB Exams)** " මුහුණත (Tile) මත Click කරන්න.

iii. ඉන්පසු ඔබට පහත දිස්වන වෙබ් පිටුවට ප්‍රවේශ විය හැක.




iv. එහි ඇති "**Apply for Exams**" මගින් අදාළ විභාගය වෙත ප්‍රවේශ විය හැක.


2. "**Apply for Exams**"




i. අයදුම් කළ හැකි විභාග සම්බන්ධ තොරතුරු ඉහත කවුළුවෙන් දිස්වේ.

ii. එහිදී විභාගය සම්බන්ධ ගැසට් නිවේදනය බාගත කළ හැක.

➢ **Apply** - පළමුව ඔබට ප්‍රවේශ වීමේ කවුළුවක් (Login Window) දර්ශනය වන අතර **එහි ඔබේ ජාතික හැදුනුම්පත් අංකය ඇතුළත් කිරීම අනිවාර්ය වේ.** එයට අමතරව තම ජංගම දුරකථන අංකය හෝ ඊ-මේල් ලිපිනය හෝ ඒ දෙකම හෝ ඇතුළත් කර "**I Agree with the Terms and Conditions**" "√" කර **reCAPTCHA** "√" කර "**Next**" Click කරන්න.




➢ ඔබට පහත කවුළුව (Verify OTP Window) දිස්වේ. ඔබගේ ජංගම දුරකථන අංකයට (SMS මගින්) හෝ ඊ-මේල් ලිපිනයට ලැබී ඇති **OTP verification code** ඇතුළත් කර "**Submit**" click කරන්න.





### 3. **මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීම**

පහත අයිතමයන් සම්පූර්ණ කිරීමේදී දක්වා ඇති උපදෙස් පිළිපදින්න.

i. සම්පූර්ණ කළ යුතු මාර්ගගත අයදුම්පතේ ඇති අයිතමයන්හි * සලකුණ යොදා ඇති සෑම අයිතමයක්ම ඔබ විසින් අනිවාර්යයෙන් පිරවිය යුතු වේ.

විභාගයට පෙනී සිටින මාධ්‍යය සඳහන් කරන්න.



ii. පෞද්ගලික තොරතුරු අදාළ පරිදි ඇතුළත් කරන්න.

## Personal Information

* Last Name With Initials (IN BLOCK CAPITAL LETTERS)

HERATH A.M.N.

Eg: HERATH A.M.N. Max Length : 90

* Names denoted by the initials (IN BLOCK CAPITAL LETTERS)

AMARAKOON MUDIYANSELAGE NAMAL HERATH

AMARAKOON MUDIYANSELAGE NAMAL HERATH Max Length : 90

* Permanent Address (IN BLOCK CAPITAL LETTERS)

254/2, PELAWATTA, BATTARAMULLA.

Must use Commas (,) as shown in the example: 254/2, PELAWATTA, BATTARAMULLA. Max Length : 120

* Gender

Male

* Ethnicity

Sinhala

* Grama Niladhari division

Pelawatta

Max Length : 50

* Divisional Secretariat

Colombo

Max Length : 50

* District

Colombo

Max Length : 30

* Date of Birth

2/15/2001

* Mobile Phone Number

0715647854

Max Length : 10

* Age as at 06.01.2025

23 Years 02 Months 01 Days

Eg: (23 Years 02 Months 01 Days) Max Length : 35

# Educational /Professional Qualifications

* G.C.E. (O/L) Examination

| | Year | Index No | Subject | Grade |
|---|---|---|---|---|
| ⊖ | 2016 | 2425871 | SINHALA LANGUAGE | A |
| ⊖ | 2016 | 2425871 | BUDDHISM | A |
| ⊖ | 2016 | 2425871 | SCIENCE | A |
| ⊖ | 2016 | 2425871 | MATHEMATICS | A |
| ⊖ | 2016 | 2425871 | ENGLISH LANGUAGE | B |
| ⊖ | 2016 | 2425871 | HISTORY | B |
| ⊖ | 2016 | 2425871 | ART | B |
| ⊖ | 2016 | 2425871 | BUSINESS & ACCT. ST | A |
| ⊖ | 2016 | 2425871 | INFOR. & COMM. TEC. | B |

⊕

* G.C.E.(A/L) Examination


| | Year | Index No | Subject | Grade |
|---|---|---|---|---|
| ⊖ | 2019 | 40125471 | PHYSICS | C |
| ⊖ | 2019 | 40125471 | BOILOGY | C |
| ⊖ | 2019 | 40125471 | CHEMISTRY | S |

⊕

* Professional Qualifications

| | Details |
|---|---|
| ⊖ | - |

⊕


## Other

* Have you been convicted by a court?

No

If "Yes" give details

-

Max Length : 150

*  මුද්‍රිත පිටපත ලබා ගැනීමෙන් පසු අනු අංක (5) හි අත්සන හා දිනය සහ අනු අංක (6) තොරතුරු අත් අකුරින් පිරවිය යුතුය.

(Please print the application form and fill the following details by hand.)

(5) අයදුම්කරුගේ ප්‍රකාශය (Declaration)


මුද්‍රිත පිටපතෙහි අදාළ ස්ථානයේ අයදුම්කරු විසින් නම අත්සන යෙදිය යුතුයි.

(6) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මුද්‍රිත පිටපතෙහි අදාළ ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නම අත්සන යෙදිය යුතුයි.

**xiv.** සම්පූර්ණ කරන ලද අයදුම්පත සංශෝධන සිදුකිරීම

අයදුම්කරු අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට වම්පස පහත රූපයේ දිස්වන පරිදි button දෙකක් දක්නට ලැබේ.



- "**Save**" - මෙය click කිරීමෙන් ඔබට අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාව තෙක් ඔබගේ තොරතුරු පිරවිය හැකි වේ. එනම් නැවත මාර්ගගත පද්ධතියට පිවිස තම තොරතුරු ඇතුළත් කිරීම/සංශෝධනය කිරීම සිදු කළ හැකිය.
- එසේම අයදුම්පත **මාර්ගගතව යොමුකර අවසන් වී ඇතිනම්** නැවත මාර්ගගත පද්ධතියට පිවිසීම සඳහා පද්ධතියට ප්‍රවේශ වන (**Our Services**) යටතේ ඇති "**Online Applications (Recruitment Exams)**"මුහුණත (Tile) මත Click කරන්න.

  නමුත්, ඔබ විසින් "**Submit this application**" click නොකර ඉදිරි ක්‍රියාවලිය සිදු නොකරන්නේ නම්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාවෙන් පසුව ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වේ.
- **"Submit this application" -** අයදුම්පතේ සියලු තොරතුරු ඇතුළත් කළ පසු ඉදිරියට යාමට "Submit this application" click කළ යුතුය.
- "**Submit this application**" click කළ පසු ඔබ විසින් ඇතුළත් කරන ලද තොරතුරු පහත රූපයේ පරිදි දිස්වේ (preview).

Personal Information

| | |
|---|---|
| Select the relevant title | -- |
| Name in Full (IN BLOCK CAPITAL LETTERS) | HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA |
| Postal Address (IN BLOCK CAPITAL LETTERS) | 254/2, PELAWATTA, BATTARAMULLA. |
| Contact Number (Mobile)(For the future communication through SMS) | 0712874125 |
| Contact Number (Residence) | 0112478452 |
| Email Address | test@gmail.com |
| Gender | Male |
| Date of Birth | 02 Jun 1992 |
| Are you a citizen of Sri Lanka? | Yes |

Educational Qualifications (English Language)

| | |
|---|---|
| Do you possess a Credit pass in English Language at the G.C.E. (O/L) or N.C.G.E. or S.S.C. or international GCSE Examination? | Yes |
| Grade obtained | C |
| Name of the examination | G.C.E.(O/L) Examination |
| Name of the Dept./ Institution | Department of Examinations |
| Year | 2003 |

- යම් හෙයකින් ඔබගේ තොරතුරු නැවත සංශෝධනය (Edit) කළ යුතු නම්, නැවත අයදුම්පත වෙත ගොස් ( ← ) , සංශෝධනය (Edit) කර, “Submit this application” click කිරීමෙන් ඉදිරියට යා හැකිය.

- ඇතුළත් කරන ලද තොරතුරු නිවැරදි නම් පහත රූපයේ පරිදි එකඟතාව පළකිරීමෙන් ඉදිරියට යා හැකිය.

☑ I hereby confirm that the information provided here is accurate, correct and complete.

Proceed

“Proceed” click කිරීමෙන් පසු පහත පරිදි දිස් වේ.





“Proceed  to payments “ click කිරීමෙන් මාර්ගගතව විභාග අයදුම්පත සඳහා මුදල් ගෙවීමේ පිටුවට යොමු වේ.

### (7) විභාග ගාස්තු ගෙවීම


**සැ.යු. අයදුම්කරුවන් හට විභාග ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය (Payment Method) වෙනස් කිරීමට හැකියාව ලබාදී ඇත්තේ එක්වරක් පමණි.**

පහත රූපයේ පෙන්වා ඇති පරිදි ඔබ විසින් විභාග ගාස්තු ගෙවීමට බලාපොරොත්තු වන ක්‍රමවේදය තෝරන්න.



- **Pay with Credit/Debit Card** ක්‍රමවේදය

- මේ සඳහා සේවා ගාස්තු වශයෙන් විභාග ගාස්තුවෙන් 1.7% ක මුදලක් අයකරනු ලබයි.
- ඉහත ක්‍රමවේදයෙන් ගෙවීම් කිරීම සඳහා ඔබගේ **Credit/Debit කාඩ්පත** අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති බැංකු **Credit/Debit** කාඩ්පතක් විය යුතුය.
- එසේ නොවන බැංකු **Credit/Debit**කාඩ්පත් මගින් ගෙවීම් කළ නොහැකිවන අතර ඔබගේ ගෙවීම ප්‍රතික්ෂේප වේ.




- **Pay with BOC** ක්‍රමවේදය


"**Pay with BOC**" මගින් මුදල් ගෙවීමේදී පහත පරිදි ඔබට යොමු අංකයක් (Reference Number) ලැබේ. එය රැගෙන ඕනෑම ලංකා බැංකු ශාඛාවක් වෙත ගොස් හෝ ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමවේදයෙන් හෝ මුදල් ගෙවීම් සිදුකර නැවත මාර්ගගත පද්ධතියට පිවිසිය යුතුය. විභාග දෙපාර්තමේන්තු ගිණුම් අංකයට පෘජුවම Slip මගින් ගෙවීම් නොකළ යුතුය.

නැවත මාර්ගගත පද්ධතියට පිවිසීම සඳහා පද්ධතියට ප්‍රවේශ වන (**Our Services**) යටතේ ඇති "**Online Applications (Recruitment Exams)**" මුහුණත (Tile) මත Click


කර හෝ https://applications.doenets.lk වෙත පිවිස එහි “**Continue after payment**” Click කරන්න.

ඉන්පසු ඔබේ යොමු අංකය (Reference Number) ඇතුළත් කර ඉදිරියට යන්න.


සැ.යු: “**Pay with BOC” මඟින් ගෙවීම් කිරීමේදී ලංකා බැංකුව විසින් සේවා ගාස්තු වශයෙන් එක් අයදුම්පතක් සඳහා රු. 20.00 ක මුදලක් අයකරනු ලබයි.**




➢ මුදල් ගෙවූ පසු නැවත මාර්ගගත පද්ධතියට පිවිස එහි ඇති “**Continue after Payment**” click කරන්න.




➢ ඉන්පසු පහත රූපයේ පරිදි ඔබගේ යොමු අංකය (**Reference Number**) පද්ධතියට ඇතුළත් කර ඉදිරියට යන්න.





➢ ඉහත ක්‍රම මඟින් මුදල් ගෙවූ පසු, මුදල් ගෙවූ බවට අදාළ ලදුපත ප්‍රදර්ශනය වන අතර, එය මුද්‍රණය කර ගත හැක. එසේම මෙම තොරතුර ඔබගේ ජංගම දුරකථන අංකයට (SMS මඟින්) හෝ ඊමේල් ලිපිනයට ද යැවේ.





### (8) අයදුම්පත මාර්ගගතව යොමු කිරීම

මුදල් ගෙවූ පසු අයදුම්පත මාර්ගගතව යොමු කිරීම සඳහා පහත රූපයේ පරිදි විභාග දෙපාර්තමේන්තු කොන්දේසිවලට (**Terms and Conditions**) එකඟවන බවට හා අයදුම්පත යොමු කිරීම තහවුරු කිරීම (**Confirm**) සිදුකළ යුතුය. ඉන්පසු "**Complete & Submit**" click කරන්න.



### **(9) අයදුම්පත බාගත කිරීම (Download) හා මුද්‍රිත පිටපත (Printout) ලබා ගැනීම**

පහත රූපයේ පරිදි “**Download my application**” click කිරීමෙන් ඔබගේ අයදුම්පත බාගත කර ගත හැක. බාගත කරගත් පසු එහි මුද්‍රිත පිටපතක් ලබාගන්න. එම මුද්‍රිත පිටපතෙහි මාර්ගගතව පුරවන ලද තොරතුරුහි කිසිදු සංශෝධනයක් (Edit) සිදු නොකළ යුතුය.




### **(10)** මාර්ගගත අයදුම්පත ලද බව දැන්වීම

අයදුම්පත් භාර ගැනීම අවසන් වූ පසු අයදුම්පත දෙපාර්තමේන්තු පද්ධතිය මගින් තහවුරු කළ පසු අයදුම්පත ලද බව SMS මගින් අයදුම්කරුට දැනුම් දෙනු ලැබේ.